කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : **23** TCA/26/01/10/07

වර්ණය : රතු

## ශ්‍රී ලංකාවට නැගෙනහිර දෙසින් පවතින පීඩන අවපාතය පිලිබඳ අනතුරු ඇඟවීම් නිවේදනය

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්** 2026 ජනවාරි මස **11** වන දින ප.ව.08.30 දක්වා වලංගු වන පරිදි 2026 ජනවාරි මස **10** දින ප.ව.08.30ට නිකුත් කරන ලදී.

### ගොඩබිම් ප්‍රදේශ සහ දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා

**ආරක්ෂිත ක්‍රියාමාර්ග ගන්න!**

**ශ්‍රී ලංකාවේ ඊසානදිග වෙරළට ඔබ්බෙන් නිරිතදිග බෙංගාල බොක්ක ප්‍රදේශයේ පැවති පීඩන අවපාතය අද දින ප.ව. 3.30 ත් 4.30 ත් අතර මුලකිව් ආසන්නයෙන් ඊසානදිග වෙරළ තීරය හරහා ගමන් කර ප.ව. 5.30 වන විට යාපනයට ගිනිකොන දෙසින් කිලෝමීටර 70 පමණ දුරින් කේන්ද්‍රගතව පැවතුනි. එය ඉදිරි පැය 12 තුළ බටහිර දෙසට ආසන්නව ගමන් කර ක්‍රමයෙන් දුර්වල වී අඩු පීඩන ප්‍රදේශයක් දක්වා පත්වීමට බොහෝ දුරට ඉඩ ඇත.**




*පීඩන අවපාතයේ ගමන් මාර්ගය. මූලාශ්‍රය: RSMC*


කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ගොඩබිම ප්‍රදේශය සඳහා :

ඉදිරි පැය 24 සඳහා තද සුළං පිළිබඳ අනතුරු ඇඟවීම.

- උතුරු පළාතේ විටින් විට හමන පැ.කි.මී. (50-60) දක්වා වන ඉතා තද සුළං සමඟ විටින් විට හමන පැ.කි.මී. 70 දක්වා වන ප්‍රහාරාත්මක සුළං ඇතිවිය හැක. පුත්තලම, මාතලේ, ත්‍රිකුණාමලය සහ නුවරඑළිය දිස්ත්‍රික්කවලත් විටින් විට හමන පැ.කි.මී. (40-50) දක්වා වන තද සුළං ඇතිවිය හැක.




කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ඉදිරි පැය **24** සඳහා තද වැසි පිළිබඳ අනතුරු ඇඟවීම.

- දිවයිනේ උතුරු අර්ධයේ අහස වලාකුළින් බරව පවතී. උතුරු පළාතෙත් පුත්තලම, අනුරාධපුර සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවලත් විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. උතුරු පළාතේ ඇතැම් ස්ථානවලට මි.මී. **100** ට වැඩි තද වැසි ඇති විය හැක.



කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**ගොඩබිම ප්‍රදේශය සඳහා:**

**සිදුවිය හැකි හානි**

- පැල්පත්වලට හා තාවකාලික ඉදි කිරීම්වලට හානි වීම .
- වහලවල ඇති තහඩු උළු ආදිය ගැලවී යාම.
- විදුලි සහ දුරකථන රැහැන් වලට හානි සිදුවිය හැක.
- ගස්වල අතු කැඩීම් සහ මාර්ග අසල ඇති විශාල ගස් ගැලවී යා හැක.
- වී වගා බිම්වලට,කෙසෙල්, පැපොල් වැනි පළතුරු වගාවන් වලටද හානි සිදුවිය හැක.
- වරාය ආශ්‍රිතව නවතා /රඳවා ඇති යාත්‍රා අංගන වලට හානි වීම
- ක්ෂණික ගංවතුර තත්ත්වයන් ඇතිවිය හැක
- වෙරළාසන්න පහත් ගොඩබිම් ප්‍රදේශ මුහුදු ජලයෙන් යටවිය හැක.


අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග:

- **වෙරල ආසන්න තාවකාලික පදිංචිකරුවන් ආරක්ෂිත ස්ථාන වලට ගමන් කිරීම. බලපෑම ඇති ප්‍රදේශවල අනෙකුත් පදිංචිකරුවන් නිවාස තුලට වී සිටීම.**
- **කඳුකර ප්‍රදේශ වල (විශේෂයෙන් නාය යාම් අවධානම සහිත ප්‍රදේශ වල) සහ ගංගා ආශ්‍රිතව පහත් බිම් වල ජීවත් වන ජනතාව මේ සම්බන්ධයෙන් විමසිලිමත්වන්න.**
- **කඳුකර ප්‍රදේශ වල මාර්ග භාවිත කරන්නන් සහ රථ වාහන පදවන්නන් මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න**
- **කඩාවැටෙන ගස්වලින් සහ විදුලි රැහැන් වලින් ආරක්ෂාවීම.**
- **ගිගුරුම් සහිත වැසි පවත්නා අවස්ථාවල රැහැන් දුරකථන සහ විදුලි උපකරණ භාවිතයෙන් වැළකීම.**
- **ඇතිවිය හැකි අයහපත් කාලගුණික තත්වය පිළිබඳ විමසිලිමත්වන ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.**
- **හදිසි තත්වයකදී ප්‍රාදේශීය ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන නිලධාරීන් ගේ සහය පතන්න.**
- **කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිලිබඳ අවධානය යොමුකරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**මුහුදු ප්‍රදේශ සඳහා:**




**මුහුදු ප්‍රදේශ සඳහා අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග:**

- <u>කොළඹ සිට පුත්තලම, මන්නාරම සහ කන්කසන්තුරේ හරහා ත්‍රිකුණාමලය දක්වා වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශවල නැවත දැනුම් දෙන තුරු ධීවර සහ නාවුක කටයුතුවලින් වැළකී සිටින ලෙස දැනුම් දෙනු ලැබේ.</u>
- <u>පුත්තලම සිට මන්නාරම සහ කන්කසන්තුරේ හරහා ත්‍රිකුණාමලය දක්වා වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශවල නැවත දැනුම් දෙන තුරු බහුදින ධීවර යාත්‍රා, ධීවර කටයුතුවලින් වැළකී සිටින ලෙස දැනුම් දෙනු ලැබේ.</u>
- කොළඹ සිට ගාල්ල සහ හම්බන්තොට හරහා මඩකලපුව දක්වා වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශවල ධීවර සහ නාවුක කටයුතුවල යෙදීම වළක්වාලමින් නිකුත් කරන ලද අනතුරු ඇඟවීම ඉවත් කරනු ලැබේ.
- නිරිතදිග බෙංගාල බොක්ක ගැඹුරු මුහුදු ප්‍රදේශවල බහුදින ධීවර බෝට්ටු සහ නාවික ක්‍රියාකාරකම් වැළැක්වීම සඳහා නිකුත් කරන ලද අනතුරු ඇඟවීම ඉවත් කරනු ලැබේ.

**මේ සම්බන්ධයෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අනාවැකි සහ නිවේදන පිළිබඳව, ධීවර සහ නාවික ප්‍රජාව අවධානයෙන් පසුවන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.**

**පද්ධතියේ හැසිරීම පිළිබඳව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නිරන්තර අවධානයෙන් සිටියි. මේ සම්බන්ධයෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන ඉදිරි අනාවැකි සහ නිවේදන පිළිබඳව අවධානයෙන් පසුවන ලෙස මහජනතාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.**

කාර්යයේ නියුතු කාලගුණ විද්‍යාඥ
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව.
දු. ක: 0112 686 686 (පැය 24 ක්‍රියාත්මකයි)